රාජ්‍ය අමාත්‍ය සනත් නිශාන්ත පෙරේරා, ජනවාරි 25, 2024 දින, කටුනායක කොළඹ අධිවේගී මාර්ගයේ සිදුවූ හදිසි රිය අනතුරකින් ජීවිතක්ෂයට පත්වීම සහ ඔහුගේ අවමංගල්‍යයේ කටයුතු, ජනවාරි 25, 2024 දින රූපවාහිනී රාත්‍රී සිංහල ප්‍රධාන පුවත් සහ, ජනවාරි 26, 2024 දින සිංහල භාෂා පුවත්පත් තුළ ආවරණය වී තිබිණි.

එහිදී, රාජ්‍ය අමාත්‍යවරයාගේ බාලවයස් දරුවන්ගේ අනන්‍යතාවයන් හෙළි වන පරිදි ඔවුන්ගේ මුහුණු ආවරණය නොකරමින් ඡායාරූප හා වීඩියෝ ඉදිරිපත් කළ සහ ඉදිරිපත් නොකළ මාධ්‍ය පහත පරිදි වෙන් කොට පෙන්වා දිය හැක.

බාලවයස් දරුවන්ට සිය පාසල් කාලය අනවශ්‍ය අතපෙවීම් හා බාධාවන්ගෙන් තොරව සම්පූර්ණ කර ගැනීමට නිදහස තිබිය යුතු බව දෙස් විදෙස් මාධ්‍ය මාර්ගෝපදේශයන් ඔස්සේ පෙන්වා දෙනු ලැබේ.

එසේම, බාලවයස් දරුවෙකු අනතුරකට හෝ හානියකට පාත්‍ර කළ හැකි කිසිදු තොරතුරක් හෝ ඡායාරූපයක් ප්‍රසිද්ධ කිරීමද නොකළ යුතු බව එලෙසින්ම මාධ්‍ය මාර්ගෝපදේශයන් පෙන්වා දෙයි.

මේ සමගම, බාල වයස් දරුවන්ගේ අනන්‍යතාවයන්, මහජන බැඳියාවට (public interest) පහසුවෙන් යටත් නොවන අතර, එසේ වීමට නම් අති විශේෂ හේතු කාරණා අවශ්‍ය වන බව ද කිව යුතුවේ.

ඔබේ අදහසට අනුව,

1) විශේෂයෙන්ම රාජ්‍ය අමාත්‍ය සනත් නිශාන්ත ජීවිතක්ෂයට පත්වීමෙන් පසු ඒ සම්බන්ධයෙන් සමාජ මාධ්‍ය ඔස්සේ දැක්වෙන ආකල්පයන්ද සමඟින් ගත් විට, ඔහුගේ දරුවන්ගේ අනන්‍යතාවයන් හෙළි කිරීමෙන් ඔවුන්ගේ අධ්‍යාපනයට හානියක් හෝ ඔවුනට හානියක් සිදු නොවනු ඇතැයි සහතික වීමට හැකිද?

2) එසේ නම්, එම දරුවන්ගේ අනන්‍යතාවයන් හෙළි වන පරිදි ඔවුන්ගේ මුහුණු ආවරණය නොකරමින් ඡායාරූප හා වීඩියෝ ඉදිරිපත් කළ මාධ්‍ය විසින් මාධ්‍ය ආචාරධර්මයන් මෙන්ම සිය මාධ්‍ය වගකීම ද කඩ කොට නැති ද?

මූලාශ්‍ර:

https://www.editorscode.org.uk/the_code.php

https://www.unicef.org/eca/media/ethical-guidelines

http://www.pccsl.lk/wp-content/uploads/2019/06/Editors-Code-Sin-1.pdf

